අමාත්‍ය මණ්ඩල සංදේශය

# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වර්තමානයේ මුහුණ දී සිටින මූල්‍ය අර්බුදය සමනය කිරීම සඳහා 'EYE' නාලිකාවේ ගුවන් කාලය බදු දීම

## 1.0 පසුබිම

1.1 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත මගින් ස්ථාපිත කර ඇති අතර ජාතික වගකීම ඉටු කරමින් දශක තුනක පමණ කාලයක් දෙස් විදෙස් ප්‍රේක්ෂකයින් සඳහා උසස් තත්ත්වයේ වැඩසටහන් ද නිවැරදි හා සත්‍ය ප්‍රවෘත්ති ද විකාශනය කරමින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබන රාජ්‍ය ආයතනයකි.

1.2 එසේ වුව ද, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පසුගිය දශකයක පමණ කාලයක සිට වර්තමානය දක්වා විවිධ හේතූන් මත පාඩු ලබන තත්ත්වයට පත් වී ඇත. තවද, භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමා වීම, 2020 වර්ෂයේ ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය තත්ත්වය, වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපාරික ආයතන වෙතින් දැන්වීම ලැබීම සීමාවීම සහ විදුලිය ඇතුළු මෙහෙයුම් වියදම් ඉහළ යාම මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර කිරීමට හේතු සාධක වී ඇත.

## 2.0 සාධාරණීකරණය

2.1 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික මූල්‍ය වාර්තාවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා මුළු අලාභය රුපියල් මිලියන 541ක් වන අතර සමුච්චිත අලාභය රුපියල් මිලියන 1,112ක් දක්වා ඉහළ ගොස් ඇත.



(+94) 11 2513467 | කාර්යාලය අලුවලකம் Office (+94) 11 2513498 (+94) 11 2512321 | ෆැක්ස් தொலைநகல் Fax (+94) 11 2513458 | වෙබ් අඩවිය සහ විද්‍යුත් තැපෑල இணையத்தளம், மின்னஞ்சல் Website and E-mail Address www.media.gov.lk secretary@media.gov

2.2 එමෙන්ම, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වත්කම්වලට වඩා වගකීම් ප්‍රමාණය රුපියල් මිලියන 701කින් වැඩි වී ඇති අතර ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ මුළු ණය ප්‍රමාණය රුපියල් මිලියන 1,300ක් වේ. එමෙන්ම, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු හිඟ බදු මුදලේ එකතුව රුපියල් මිලියන 316 කි.

2.3 ඒ අනුව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ස්වකීය වගකීම් පියවීමට නොහැකි තත්ත්වයකට පත් වී ඇති අතර, සංස්ථාවේ වැටුප් ඇතුළු පුනරාවර්තන ගෙවීම් කිරීමට නොහැකි තත්ත්වයක් ද මේ වනවිට නිර්මාණය වී ඇත.

2.4 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මේ වනවිට මුහුණ දී සිටින මෙම දැඩි මූල්‍ය අර්බුදය සමනය කිරීම සඳහා අතිරේක ආදායම් උත්පාදනය කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමුඛ කළමනාකාරීත්වයේ අවධානය යොමු වී ඇත.

2.5 ඒ අනුව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හිමිකාරීත්වය දරන 'EYE' නාලිකාවෙහි ගුවන් කාලය 'SBC TV' නාලිකාව විකාශනය කිරීම සඳහා VIS Broadcasting (Pvt.) Ltd ආයතනය වෙත මාස හයක (06) කාලයක් සඳහා මසකට "රුපියල් මිලියන 25+ බදු" යන අගයකට බදු දීම සඳහා රූපවාහිනී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. එමෙන්ම, මේ සඳහා වන බදු ගිවිසුමෙහි කොන්දේසි යටතේ මසක දැනුම් දීමකින් බදු ගිවිසුම අවලංගු කිරීම සඳහා වන කොන්දේසිය ද ඇතුළත් කිරීමට නියමිත ය.

2.6 තවද, VIS Broadcasting (Pvt.) Ltd ආයතනය මෙම අමාත්‍යාංශයේ බලපත්‍රලාභී රූපවාහිනී ආයතනයක් වන අතර එම ආයතනය විකාශනය කරනු ලබන 'SBC TV' නාලිකාව මේ වනවිට ලංකා ප්‍රිමියර් ලීග් (LPL) ක්‍රිකට් තරඟාවලියේ නිල විකාශන හිමිකාරීත්වය දරමින් ඒ සඳහා විශාල ප්‍රේක්ෂක ආකර්ෂණයක් ද දිනාගෙන ඇත.

2.7 ඉහත කරුණු සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතියට යටත්ව මාගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 'EYE' නාලිකාවෙහි ගුවන් කාලය 2023.07.30 දින සිට මාස හයක (06) කාලයක් සඳහා 'SBC TV' නාලිකාව විකාශනය කිරීම සඳහා VIS Broadcasting (Pvt.) Ltd ආයතනය වෙත බදු දී ඇත. මෙලෙස 'EYE' නාලිකාවෙහි ගුවන් කාලය බදු දීම පාරදෘශ්‍ය නොවන බව මා නිරීක්ෂණය කරන අතරම වඩාත් පාරදෘශ්‍ය ක්‍රමවේදයක් අනුගමනය කරමින් අභිලාශයන් (EOI) කැඳවා 'EYE' නාලිකාවෙහි ගුවන් කාලය බදු දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ද අපේක්ෂා කෙරේ.